**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ, ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ දෙපාර්තමේන්තුගත අධිලේඛන ප්‍රතිරූපන සහායක/ රන් අකුරු මුද්‍රණකරු/ අධිලේඛන හා පොත් බැඳුම්කරු තනතුරුවල III වන ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම**

1.0 ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පවතින අධිලේඛන ප්‍රතිරූපන සහායක, රන් අකුරු මුද්‍රණකරු, අධිලේඛන හා පොත් බැඳුම්කරු III වන ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා නිලධරයන් බඳවා ගැනීමට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවන අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී සහ වෘත්තීය පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන, සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාවක්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0 ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව **8** වගුව මගින් දැක්වේ. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප :- අංක **03/2016** හා **2016.02.25** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, අධිලේඛන ප්‍රතිරූපන සහායක/ රන් අකුරු මුද්‍රණකරු/ අධිලේඛන හා පොත් බැඳුම්කරු III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය PL 2 -2016, රු. **25,250/- 10×270/- 10×300/- 10×330/- 12×350/-** රු. **38,450/-** වේ. රු. **28,250/=** න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද, රු. **31,280/=** න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීම ද, රු. **34,600/=**න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතු ය. එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

5.0 මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔවුන් යටත් විය යුතු වේ. තව ද, ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට නිලධාරීන් විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

6.0 මෙම තනතුරු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු වන හෙයින් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රධාන කාර්යාලයේ හෝ ශාඛා කාර්යාලයන්හි සේවය කිරීම අනිවාර්ය වේ.

7.0 සුදුසුකම් :- අධිලේඛන ප්‍රතිරූපන සහායක/ රන් අකුරු මුද්‍රණකරු/ අධිලේඛන හා පොත් බැඳුම්කරු III වන ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(1) අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හය **(06)** ක් සමත් වී තිබීම

(ආ) අධිලේඛන ප්‍රතිරූපන සහායක හා රන් අකුරු මුද්‍රණකරු තනතුරු උදෙසා වන කල්හි සමත් විෂයන් හය **(06)** අතුරින් එක් විෂයක් විද්‍යාව විෂය සඳහා විය යුතු ය.

(2) වෘත්තීය සුදුසුකම් :

(අ) <u>අධිලේඛන ප්‍රතිරූපන සහායක හා රන් අකුරු මුද්‍රණකරු</u> තනතුරුවලට නියම කර පහත දක්වා ඇති ආකාරයට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි **(NVQ)** අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවක් ලබාගෙන තිබීම

| තනතුර | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| අධිලේඛන ප්‍රතිරූපන සහායක | ඡායාරූප ශිල්පය |
| රන් අකුරු මුද්‍රණකරු | මුද්‍රණ ශිල්පය |

(ආ) <u>අධිලේඛන හා පොත් බැඳුම්කරු</u> තනතුරට නියමිත කාර්මික නිපුණතාවන්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි අදාළ කෙරෙනුයේ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවක් ලබාගෙන තිබීම

හෝ

ජාතික ආධුනිකත්ව මණ්ඩලය මඟින් පවත්වනු ලබන දෑ අවුරුදු පොත් බැඳුම්කරුවන් පුහුණු කිරීමේ පාඨමාලාවට සහභාගී වී සහතිකපත් ලබා තිබීම

හෝ

ජාතික ආධුනිකත්ව මණ්ඩලය මඟින් පවත්වනු ලබන එක් අවුරුදු පොත් බැඳුම්කරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව සම්පූර්ණ කිරීම සහ පිළිගත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ රජයට අනුබද්ධ වෙනත් ආයතනයක එක් (01) වසරක පොත් බැඳීම පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම

(3) පළපුරුද්ද

| තනතුර | පළපුරුද්ද |
|---|---|
| අධිලේඛන ප්‍රතිරූපන සහායක | අදාළ නොවේ. |
| රන් අකුරු මුද්‍රණකරු | |
| අධිලේඛන හා පොත් බැඳුම්කරු | පොත් බැඳීම පිළිබඳව එක් (01) වසරක පළපුරුද්ද |

(4) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(5) වෙනත්

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

(ඇ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතු ය.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2019.02.07 දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**8.0** අයදුම්පත් කැඳවීම

පහත වගුවේ සඳහන් පරිදි පවතින තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවේ.

| අමාත්‍යාංශය | දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | අධිලේඛන ප්‍රතිරූපන සහායක | **01** |
| | | රන් අකුරු මුද්‍රණකරු | **01** |
| | | අධිලේඛන හා පොත් බැඳුම්කරු | **15** |

**9.0** බඳවා ගැනීමේ ක්‍රමය

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

(අ) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

| නිර්ණායකය | | ලකුණු |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස. උසස්පෙළ සමත්ව තිබීම (ලකුණු 5) | 15 |
| | අ.පො.ස. සා/පෙළ විභාගයේ දී ගණිතය, භාෂාව, දෙවැනි රාජ්‍ය භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ වෙනත් භාෂා සඳහා සාමාර්ථයක් ලබා තිබීම (එක් විෂයක් සඳහා ලකුණු 2 බැගින් උපරිම විෂයන් 5ක් සලකා බලනු ලැබේ.) (ලකුණු 10) | |
| පළපුරුද්ද | විෂය ක්ෂේත්‍රයට අදාළව රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක පූර්ව සේවා පළපුරුද්ද (මූලික සුදුසුකම් ඉක්මවා ඇති වසර ගණන) වසරකට ලකුණු 10 බැගින් උපරිම ලකුණු 40 (ලකුණු 40) | 60 |
| | රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක පූර්ව සේවා පළපුරුද්ද වසරකට ලකුණු 5 බැගින් උපරිම ලකුණු 20 (ලකුණු 20) | |
| ක්ෂේත්‍රයට අදාළව රජය විසින් පිළිගත් ආයතනයකින් හදාරා ඇති අමතර පාඨමාලා හා ලබා ඇති පුහුණුවීම් | ඉල්ලුම් කරන විෂය ක්ෂේත්‍රයට අදාළව NVQ 2 මට්ටමට ඉහළ පාඨමාලාවක් හදාරා තිබීම (ලකුණු 5) | 10 |
| | විෂය ක්ෂේත්‍රයට අදාළව රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික පිළිගත් ආයතනයක ලබා ඇති වෙනත් පුහුණුවීම් එක් පුහුණුවකට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 5 (ලකුණු 5) | |
| අමතර සුදුසුකම් | බාහිර ක්‍රියාකාරකම් (ක්‍රීඩා, ස්වේච්ඡා සංවිධාන, පොදු කටයුතු) සඳහා සහභාගිත්වය, නායකත්වය දැරීම වෙනුවෙන් එක් එක් ක්ෂේත්‍රයකට ලකුණු 2 බැගින් උපරිම ලකුණු 10 (ලකුණු 10) | 10 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | පෞරුෂය (ලකුණු 2) | 5 |
| | සන්නිවේදන හැකියාව (ලකුණු 3) | |
| මුළු ලකුණු | | 100 |

සටහන - තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම්, පුහුණු සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය.

(ආ) වෘත්තීය පරීක්ෂණය

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | 100 | 40% |

**10.0** ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් හෝ අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

**11.1** නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය.

**11.2** අයදුම්පත්‍ර **2019.02.07** දිනට පෙර, **"**ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, නො. **07**, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ **07"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "අධිලේඛන ප්‍රතිරූපන සහායක/ රන් අකුරු මුද්‍රණකරු/ අධිලේඛන හා පොත් බැඳුම්කරු - III වන ශ්‍රේණියට බඳවා ගැනීම" යන්න සඳහන් කළ යුතු ය. (අයදුම් කරන තනතුරු නාමය පමණක් නිවැරදිව සඳහන් කරන්න.)

**12.0** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**13.0** අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

**14.0** අත්සන සහතික කිරීම

අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසැලක විදුහල්පතිවරයෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. **498,960.00** ක හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධරයෙකු හෝ පූජ්‍ය ස්ථානයක් භාර විහාරාධිපති/ පූජකවරයෙකු මඟින් සහතික කරවාගෙන ඉදිරිපත් කළ යුතු ය.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

..........................................

ආචාර්ය නදීරා රූපසිංහ
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්

ආචාර්ය නදීරා රූපසිංහ
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
අංක. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

**2019** ජනවාරි මස **16** දින
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
නො. **07**,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ **07**.
දු.ක. **011 2696917/ 011 2694523**

ආදර්ශ අයදුම්පත්‍රය

අධිලේඛන ප්‍රතිරූපන සහායක/ රන් අකුරු මුද්‍රණකරු/ අධිලේඛන හා පොත් බැඳුම්කරු III ශ්‍රේණියට බඳවා ගැනීම

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අයදුම්කරන භාෂා මාධ්‍යය

සිංහල - 2

දෙමළ - 3

ඉංග්‍රීසි - 4

1. මුලකුරු සමඟ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ..............................................................................

2. සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ..............................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය :

4. ලිපිනය ස්ථිර : ..............................................................................

රාජකාරී : ..............................................................................

5. ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී – 1 පුරුෂ - 0

6. උපන් දිනය : වර්ෂය :.......... මාසය : ........... දිනය : ..........

අයදුම්පත් කැඳවන දිනට වයස : අවුරුදු :.......... මාස : ........... දින : ..........

7. දුරකථන අංකය

පෞද්ගලික :................................... රාජකාරී : ...............................

8. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය

I. පළමුවර ප්‍රතිඵල : වර්ෂය .................. මාසය .................... මාධ්‍යය ............

විභාග අංකය : ..........................................

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II. දෙවන වර ප්‍රතිඵල : වර්ෂය .................. මාසය .................... මාධ්‍යය ............
විභාග අංකය : .......................................

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

I. විභාගයේ වර්ෂය හා මාසය : ......................................................

II. විභාග අංකය : ......................................................

III. ප්‍රතිඵල

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

9 වෘත්තීය සුදුසුකම් :

1. ........................................................................................................
2. ........................................................................................................
3. ........................................................................................................

10 වෙනත් සුදුසුකම් :

1. ........................................................................................................
2. ........................................................................................................
3. ........................................................................................................

11 තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :

1. ........................................................................................................
2. ........................................................................................................
3. ........................................................................................................

12 දැනට යම් කිසි තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

I. තනතුර හා ශ්‍රේණිය : ............................................................

II. සේවය : ............................................................

III. පත්වූ දිනය : ............................................................

IV. ආයතනය : ............................................................

13 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

14 අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම් පත්‍රයේ මවිසින් සපයා ඇති සියළු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

............................................

අයදුම්කරුගේ අත්සන

දිනය : ........................................

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ............................................................ මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ ඇය මා ඉදිරිපිට දී අත්සන් තබන ලද බවත් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන : ............................................
දිනය : ............................................
සහතික කරන්නාගේ නම : ............................................
තනතුර : ............................................
ලිපිනය : ............................................ නිල මුද්‍රාව :

රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය

............................................ මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ස්ථිර/ තාවකාලික/ අනියම් සේවකයෙකු/ සේවිකාවක ලෙස සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධරයා

(නිල මුද්‍රාව)

දිනය :............................................